සියලුම හිමිකම් ඇවිරිණි/முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
தென் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education, Southern Province

13 ශ්‍රේණිය අවසාන වාර පරීක්ෂණය - 2026
தரம் 13 ஆண்டிறுதிப் பரீட்சை - 2026/Grade 13 Final Term Test - 2026

# සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය - I

29 S I

කාලය / நேரம் / Time } පැය 2 යි

නම / பெயர் / Name } ..........................................................

විභාග අංකය / சுட்டிலக்கம் / Index No. ..............................

## (A) කොටස

උපදෙස්:

- සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- අංක (1) සිට (50) තෙක් ප්‍රශ්නවල දී ඇති (1), (2), (3), (4), (5) යන පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරාගෙන උත්තර පත්‍රයේ (X) ලකුණ යොදන්න.
- පාරිභාෂික වචන හා යෙදුම් ඒ අයුරින් ම භාවිත කර ඇත.

1) 1968 – 1969 වකවානුවේ "පුවත්පත් කලාවේදය" (Journalism) නම් පාඨමාලාවේ විෂය නිර්දේශ නිර්මාණය කරන ලද්දේ,
(1) මහාචාර්ය විමල් දිසානායක මහතා ය.
(2) මහාචාර්ය සුනන්ද මහේන්ද්‍ර මහතා ය.
(3) ආචාර්ය එඩ්වින්ආරියදාස මහතා ය.
(4) ආචාර්ය පියසෝම මෙදිස් මහතා ය.
(5) මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍ර මහතා ය.

2) ඕනෑම සන්නිවේදන ක්‍රියාවලියක් යම් මට්ටමකට පාලනය කිරීමට හැකියාව ලැබෙන්නේ,
(1) බලපෑමට ය.
(2) ප්‍රතිපෝෂණයට ය.
(3) ග්‍රාහකයාට ය.
(4) මූලාශ්‍රයට ය.
(5) සන්නිවේදකයාට ය.

3) පොදු අරමුණක් ජය ගැනීමට පිරිසක් ඒකරාශිව කරන සන්නිවේදනය,
(1) අන්තර්වර්ති පුද්ගල සන්නිවේදනය නම් වේ.
(2) පුද්ගලාන්තර සන්නිවේදනය නම් වේ.
(3) මහජන සන්නිවේදනය නම් වේ.
(4) කණ්ඩායම් සන්නිවේදනය නම් වේ.
(5) ජන සන්නිවේදනය නම් වේ.

4) එදිනෙදා ජීවිතයට අවශ්‍ය තොරතුරු සහිත යම් නිශ්චිත කාලවකවානුවක අඛණ්ඩව ප්‍රකාශයට පත්කරනු ලබන නොබැඳී මුද්‍රිත ප්‍රකාශනය.
(1) පුවත්පත ලෙස හැඳින්වේ.
(2) අත්පත්‍රිකාව ලෙස හැඳින්වේ.
(3) පොත් පිංච ලෙස හැඳින්වේ.
(4) සඟරාව ලෙස හැඳින්වේ.
(5) ග්‍රන්ථය ලෙස හැඳින්වේ.

5) වර්තමාන ජනප්‍රිය සංස්කෘතියේ ඇති රූපවාහිනී මාධ්‍ය තුළින් ඉස්මතු කරන ලක්ෂණය,
(1) අධ්‍යාපනය යි.
(2) මානව හිමිකම යි.
(3) පරිභෝජනවාදය යි.
(4) සෞන්දර්යාත්මක චින්තනය යි.
(5) සංවර්ධනාත්මක චින්තනය යි.

0071



CamScanner

6) ජනමාධ්‍ය තුළ ඇති මායාව හා යථාර්ථය හඳුනාගැනීමට උපකාරී වන සාධකය

(1) මාධ්‍ය අධ්‍යාපනය ලෙස හඳුන්වයි.
(2) මාධ්‍ය සාක්ෂරතාව ලෙස හඳුන්වයි.
(3) පරිකල්පනය ලෙස හඳුන්වයි.
(4) මාධ්‍ය විචාරය ලෙස හඳුන්වයි.
(5) මාධ්‍ය අවබෝධය ලෙස හඳුන්වයි.

7) සිනමා පටයක ප්‍රධාන චරිතයට පසුබිම් වන පරිසරයේ අලංකාරය පෙන්වීමට අවශ්‍ය රූප රාමුව වනුයේ,

(1) සමීප රූප රාමුවයි. (Close up)
(2) මධ්‍යම රූප රාමුවයි (Medium Shot)
(3) අතිදූර රූප රාමුවයි. (Extreme Long Shot)
(4) ඉතා සමීප රූප රාමුවයි. (Big Closeup)
(5) දූර රූප රාමුවයි. (Long Shot)

8) මහජන සම්බන්ධතා මහජන තොරතුරු ආකෘතිය (Public Information Model) තුළ දක්නට ලැබෙන්නේ,

(1) ද්විමාර්ගික සන්නිවේදනයකි.
(2) සංවෘත සන්නිවේදනයකි.
(3) අසමබර සන්නිවේදනයකි.
(4) ඒක මාර්ගික සන්නිවේදනයකි.
(5) මිශ්‍රිත සන්නිවේදනයකි.

9) සංවර්ධන සන්නිවේදනයේ දී ජනතා කේන්ද්‍රීයතාවය (People centered) යනු,

(1) හැසිරීම් වෙනස්කම් සඳහා සන්නිවේදනය කිරීම ය.
(2) අවම අවශ්‍යතා සම්පූර්ණ වීමට සන්නිවේදනය කිරීම ය.
(3) පුද්ගලයන්ගේ නිපුණතා යහපැවැත්ම උදෙසා ශක්තිමත් කිරීම ය.
(4) මූලික සමාජ සේවාවලට විශ්වීය ප්‍රවේශ නිර්මාණය කිරීම ය.
(5) ජෛව විවිධත්වය සුරැකීමට ග්‍රාමීය ප්‍රජාව යොමු කිරීම ය.

10) සහනියාමනය වූ කලී,

(1) මාධ්‍ය මගින් ස්වේච්ඡාවෙන් කරනු ලබන ක්‍රියාවකි.
(2) මාධ්‍ය නියෝජිතයන් හා නීතිය යොදාගෙන කරනු ලබන ක්‍රියාවකි.
(3) නීතිය පමණක් ගුරු කොටගෙන කරනු ලබන ක්‍රියාවකි.
(4) පර්යේෂණ පදනම් කරගෙන කරනු ලබන ක්‍රියාවකි.
(5) ආයතනික අභ්‍යන්තරය තුළින් කරනු ලබන ක්‍රියාවකි.

11) "පුරවැසියාගේ හා පාරිභෝගිකයාගේ අභිමතාර්ථ, අවශ්‍යතා හා භූමිකා එකිනෙකට වෙනස් වේ...." මෙම ප්‍රකාශය කරන ලද්දේ,

(1) ග්‍රැහැම් මර්ඩොක් ය.
(2) ග්‍රැහැම් වොලස් ය.
(3) විල්බර් ශ්‍රාම් ය.
(4) ඇලිසන් හර්න් ය.
(5) අයිරිස් ජෙනීස් ය.

12) සන්නිවේදනය සමීක්ෂණ ක්‍රියාවලියක දී සිදුවීමක වැඩිම වාර ගණනක් පෙන්නුම් කරන අගය හඳුන්වන්නේ,

(1) මධ්‍යනය ලෙස ය.
(2) මාතය ලෙස ය.
(3) පන්ති ප්‍රාන්තරය ලෙස ය.
(4) අනුපාතය ලෙස ය.
(5) මධ්‍යස්ථ අගය ලෙස ය.



CS CamScanner

13) පහත ප්‍රකාශ අතරින් නොගැළපෙන වගන්තිය තෝරන්න.

(1) ගැමි මාධ්‍ය බොහෝ දුරට නම්‍යශීලී මාධ්‍ය වේ.

(2) රූපවාහිනිය හැමවිටම විවිධාකාර විචිත්‍රවත් ආකෘතින්වලින් සමන්විත වේ.

(3) Twitter එකකින් ලෝකය පුරා පුද්ගලිකව තොරතුරු බෙදා හැරිය හැකි ය.

(4) භාව ප්‍රකාශනය ඉහළින්ම කිරීමට ගැමි මාධ්‍ය යොදාගත හැකි ය.

(5) විද්‍යුත් සබඳතා භාවිත කරමින් පයීතයකින් වෙනත් පයීතයකට ළඟා වීම ස්වයංකරණය නම් වේ.

14) දොරටුපාල සංකල්පය පිළිබඳ මුල්ම අදහස ප්‍රකාශ කළේ,

(1) ෂැනොන් - වීවර් ය.

(2) කර්ට ලෙවින් ය.

(3) කාර්ල් අයිවර් හව්ලන්ඩ් ය.

(4) ජෝර්ජ් ගාබනර් ය.

(5) හැරල්ඩ් ඩී. ලැස්වෙල් ය.

15) බලපත්‍ර ලබාදීම,

(1) ආයතනික මහජන සම්බන්ධතාවකි.

(2) වෘත්තීය මහජන සම්බන්ධතාවයකි.

(3) රාජ්‍ය මහජන සම්බන්ධතාවකි.

(4) ව්‍යාපාර මහජන සම්බන්ධතාවකි.

(5) මාධ්‍ය මහජන සම්බන්ධතාවකි.

16) නවෝත්පාදනය සම්බන්ධ සාවද්‍ය ප්‍රකාශය තෝරන්න.

(1) නව සොයා ගැනීමක් සමාජයට ප්‍රවේශණය කරවන්නකි.

(2) නව තාක්ෂණය ප්‍රජාවට ප්‍රවේශණය කරවන්නකි.

(3) නිර්මාණාත්මක චින්තනයක් අන්තර්ගත වූවකි.

(4) විල්බර් ශ්‍රාම් ද අදහස් දැක්වූ සංකල්පයකි.

(5) නවීකරණ න්‍යාය හා සම්බන්ධිත සංකල්පයකි.

17) ප්‍රසිද්ධ රැගුම් පාලක මණ්ඩලය ලබාදෙන “ U ”සහතිකය මගින් ප්‍රකාශ කරනුයේ,

(1) සිනමා පටය අසීමාන්තික මහජන ප්‍රදර්ශනයට සුදුසු ය.

(2) වැඩිහිටියන්ට පමණක් නැරඹීමට සිනමා පටය සුදුසු ය.

(3) සිනමාපටය ප්‍රදර්ශනය නොකර ඉවත දැමීමට සුදුසු ය.

(4) සිනමා පටය නැරඹීමට වඩාත් සුදුසු වන්නේ වැඩිහිටියන්ට ය.

(5) සිනමා පටය ශාස්ත්‍රීය සෞන්දර්යාත්මක බවින් යුක්ත ය.

18) සමීක්ෂණයක දත්ත රැස් කිරීම සම්බන්ධ නොගැළපෙන වගන්තිය තෝරන්න.

(1) නිවැරදි ප්‍රමිතියට අනුව සමීක්ෂණය කිරීමෙන් දෝෂ අවම කර ගත හැකිය.

(2) ආකල්ප - මතවාද - විශ්වාස ..... යනාදී පුළුල් පරාසයක ඇති තොරතුරු එකවරම රැස් කර ගත හැකිය.

(3) විශාල නියැදියකින් තොරතුරු පහසුවෙන් රැස්කර ගත හැකිය.

(4) මෘදුකාංග භාවිත කර/ නොකර දත්ත විශ්ලේෂණය කර ගත හැකිය.

(5) අතීත තත්ත්ව පිළිබඳ දත්ත පහසුවෙන් එක්රැස් කරගත හැකිය.

19) තනි පුද්ගලයෙකු මූලික කරගනිමින් සිදුකරන ප්‍රචාරණ කාර්යය (Personal casting) සමග වැඩිම සම්බන්ධතාව දක්වන මාධ්‍යය”

(1) ගුවන් විදුලිය යි.

(2) රූපවාහිනිය යි.

(3) මුහුණු පොත යි. (Face book)

(4) විද්‍යුත් පුවත්පත යි.

(5) You Tube (යූ ටියුබ්) නාලිකාව යි.



CS CamScanner

20) රංගභූමිය ලෙස වී කමත යොදා ගෙන රඟ දක්වන්නේ,

(1) වෙස් මුහුණු නාටකය යි.
(2) සොකරි නාටකය යි.
(3) කෝලම් නාටකය යි.
(4) කොහොඹ කංකාරිය යි.
(5) තෙරුක්කූත්තු ශාන්තිකර්මය යි.


21) සමූහ සන්නිවේදනයට අදාළ ඵලදායී කථන උපක්‍රම පිළිබඳ පහත දක්වා ඇති අදහස් නිරීක්ෂණය කරන්න.

A - ග්‍රාහක කේන්ද්‍රීය වචන භාවිත කළ හැකි ය.
B - ඉහළ ශ්‍රවණ නිපුණතාවක් අවශ්‍ය වන්නකි.
C - නිර්වාචික චර්යා භාවිත කළ හැකි ය.
D - කතාව හැම විටම දීර්ඝ වේ.

ඉහත උපක්‍රම අතුරෙන් ඵලදායී කථනයට වඩාත් අදාළ වන්නේ,

(1) A හා B ය.
(2) B හා C ය.
(3) A හා C ය.
(4) B හා D ය.
(5) C හා D ය.

- අංක 22 සිට 24 දක්වා ප්‍රශ්නවලට පහත දක්වා ඇති සන්නිවේදන ආකෘතිය පදනම් කරගෙන පිළිතුරු සපයන්න.




22) මෙම ආකෘතියට අවශ්‍ය පදනම සපයන ග්‍රන්ථය,

(1) සමාජ සංවිධානය නම් විය.
(2) ජනමතය නම් විය.
(3) රිටොරික් නම් විය.
(4) ඡන්දස් අලංකරණ ශාස්ත්‍රය නම් විය.
(5) ජනමාධ්‍යයේ සිද්ධාන්ත හතර නම් විය.

23) ඉහත ආකෘතිය හා ලැස්වෙල් ආකෘතියේ දක්නට ලැබෙන ග්‍රාහක චර්යා රටාව වෙනස් කරන සම සන්නිවේදන මූලිකාංගය,

(1) බාධක නම් වේ.
(2) අත්දැකීම් පසුතලය නම් වේ.
(3) ප්‍රතිචාරය/ ප්‍රතිපෝෂණය නම් වේ.
(4) විකේතිකරණය නම් වේ.
(5) බලපෑම නම් වේ.

24) ඉහත 22 හා 23 යන ප්‍රශ්න වල සඳහන් සන්නිවේදන ආකෘතිවලින් HUB ආකෘතිය වෙනස් වන්නේ එමගින්,

(1) බාධකවල ස්වභාවය චක්‍රව දක්වා ඇති නිසා ය.
(2) නාලිකාව පිළිබඳ දක්වා ඇති නිසා ය.
(3) රේඛීය ආකෘති සම්ප්‍රදාය අනුගමනය කර ඇති නිසා ය.
(4) ජනමාධ්‍ය සන්නිවේදනය ප්‍රකටව පහදා ඇති නිසා ය.
(5) සන්නිවේදක හා ග්‍රාහක සම්බන්ධය ඒකපාර්ශවීය කර ඇති නිසා ය.

25) එක්තරා ජනමාධ්‍ය ගුරුභවතෙකු මාධ්‍ය සාක්ෂරතා සිද්ධාන්ත කටපාඩමින් විස්තර කළ අතර, එය අසාගෙන සිටි රවී කිසිදු අඩුපාඩුවකින් තොරව එකී මාධ්‍ය සාක්ෂරතා සිද්ධාන්ත මතකයෙන් පංතියට ඉදිරිපත් කළේය. ………… මෙම සිද්ධියට සමීපවන සන්නිවේදන අර්ථ දැක්වීම ඉදිරිපත් කළේ,

(1) Oxford Dictionary යයි. (ඔක්ස්ෆර්ඩ් ශබ්ද කෝෂය)
(2) විල්බර් ශ්‍රාම් ය.
(3) චාල්ස් හෝටන් කූලි ය.
(4) ෂැනොන් - වීවර් ය.
(5) එඩ්වඩ් සැපි ය.



CamScanner

26) සමීක්ෂණයකදී දත්ත විශ්ලේෂණයට යොදා නොගන්නා මෘදුකාංගයකි,

(1) Excel ය. (2) SPSS ය.
(3) Minitab ය. (4) ATLAS.ti ය.
(5) Microsoft publish

27) පුද්ගලයකු මාධ්‍ය සාක්ෂරතා කුසලතාවලින් යුක්ත කිරීමට අවශ්‍ය වනුයේ,

(1) මාධ්‍ය විචාර නිපුණතාවයි. (2) මාධ්‍ය සංජානන නිපුණතාවයි.
(3) සන්නිවේදන නිපුණතාවයි. (4) මාධ්‍ය අධ්‍යාපනයයි.
(5) සහවේදනයයි.

28) ඕනෑම සංස්කෘතික ප්‍රභේදයක් ගොඩනැංවීමට හා පවත්වාගෙන යාමට දායකත්වය සපයන්නේ,

(1) ජනශ්‍රැති සාහිත්‍යය යි. (2) අධ්‍යාපනය යි.
(3) ජනතා ක්‍රියාකාරීත්වය යි. (4) ආකල්ප- ගුණධර්ම- සාරධර්මයි.
(5) සන්නිවේදන ක්‍රියාවලිය යි.

29) ".... යහපත් සිතින් යුතුව මානව සදාචාර සම්පන්නභාවය ඇති කිරීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග මහජන සම්බන්ධතා නම් වේ....." මෙම අර්ථ දැක්වීම සිදු කරනු ලැබුවේ,

(1) වෙබ්ස්ටර් නව කොලීජියෙට් ශබ්ද කෝෂය (2) චාර්ල්ස් ප්ලැකාඩ් ය. (Charles Placara)
(3) එඩ්වඩ් L. බර්නිස් ය. (Edward L. Bernays) (4) සැම් බ්ලැක් ය. (Sam Blacl)
(5) පිලිප් J. කිචන් ය. (Philip J. Kitchen)

30) "නිර්මාණාත්මක සන්නිවේදනය මුල්ම ඉගෙනීම ඇත්තේ ජනශ්‍රැතියේය." ඒ අනුව ජනශ්‍රැතිය වඩාත් අවැසි වනුයේ,

(1) අතීතය පිළිබඳ ආවර්ජනය කිරීමට ය. (2) ජනයාගේ සමාජ භූමිකා අධ්‍යයනය කිරීමට ය.
(3) සංස්කෘතික සම්ප්‍රේෂණය කිරීමට ය. (4) විනෝදාස්වාදය ලබා ගැනීමට ය.
(5) නිර්මාණාත්මක ප්‍රස්තුත ගවේෂණය කිරීමට ය.

31) පහත ප්‍රකාශ අතරින් නිරවද්‍ය වගන්තිය තෝරන්න.

(1) නූතන අවධිය වන විට අදෘශ්‍යමාන බලවේගවල පාක්ෂිකත්වය සංස්කෘතිය ලෙස පිළිගෙන ඇත.
(2) සංස්කෘතිය වූ කලී විකෘතියේ ප්‍රකෘතිය ලෙස හඳුන්වනු ඇත.
(3) සංස්කෘතික සංකල්පය අද වනවිට පවරාදීමට නොහැකි එකක් වී ඇත.
(4) සමාජය - සංස්කෘතිය සහ පුද්ගලයා පවතින්නේ සංදේශනය ඔස්සේ සිදුවන සමාජ අන්තර් ක්‍රියාව නිසා ය.
(5) සංස්කෘතිය පවත්වාගෙන යාමට ලැදියාවන් හා අවශ්‍යතාවන් එතරම් වැදගත් නොවනු ඇත.

32) බහුජාතික සමාගම් විසින් සැලසුම් සහගතව ප්‍රවර්ධනය කරන සංස්කෘතික වර්ගය/ ප්‍රභේදය,

(1) ජන සංස්කෘතිය නම් වේ. (2) සම්භාව්‍ය සංස්කෘතිය නම් වේ.
(3) ජනප්‍රිය සංස්කෘතිය නම් වේ. (4) මාධ්‍ය සංස්කෘතිය නම් වේ.
(5) වෙළඳ සංස්කෘතිය නම් වේ.

PAST PAPERS WIKI

0067



CamScanner

33) පහත ප්‍රකාශ නිරීක්ෂණය කරන්න.

A - අන්තර්වර්ති පුද්ගල සන්නිවේදනය සියලු සන්නිවේදන ක්‍රියාවලට පදනම සපයයි.

B - සියලු සන්නිවේදන ක්‍රියාවලීන්වල ආරම්භය හා අවසානය සනිටුවන් වන්නේ අන්තර්වර්තිව ය.

C - සහානුභූතියට මනස යොමු කිරීමට අන්තර්වර්ති සන්නිවේදනය අවැයි වේ.

D - ස්ව සංකල්ප පෝෂණයේ ඍජු දායකත්වය සපයන්නේද අන්තර්වර්ති සන්නිවේදන ප්‍රභේදය මගිනි.

ඉහත ප්‍රකාශ අතරින් සත්‍ය ප්‍රකාශය/ ප්‍රකාශ විය හැක්කේ,

(1) A හා B පමණි. (2) A හා C පමණි.
(3) B හා C පමණි. (4) A, B හා D පමණි.
(5) A, B, C හා D යන සියලු ප්‍රකාශ සත්‍ය වේ.

34) සංදේශයක් අර්ථකථන ක්‍රියාවලියට ලක් කරනුයේ,

(1) ආකේතකරය යි. (2) විකේතකරය යි.
(3) බලපෑමයි. (4) ප්‍රතිපෝෂණයයි.
(5) මූලාශ්‍රයයි.

35) පුවත්පතක දෘෂ්ටිමය ආකර්ෂණය වැඩි කිරීමට යොදාගැනීමට අවම ඉඩක් ඇති උපක්‍රමය,

(1) චිත්‍ර හා කාටූන් ය. (2) විවිධ අක්ෂර මොඩල හා ප්‍රමාණයන් ය.
(3) කෙටි වැකි හා කථන බස්වහර භාවිතයන් ය. (4) නිශ්චල ඡායාරූප හා විවිධ වර්ණ භාවිතයන් ය.
(5) රේඛා හා විවිධ හැඩතල භාවිතයන් ය.

36) ලේඛකයෙක් තම ග්‍රන්ථ නිර්මාණ විකිණීම කළ අවස්ථාවක නැවත එම ග්‍රන්ථ නිර්මාණය ප්‍රතිනිෂ්පාදනය කරන අවස්ථාවේ තම නම මුද්‍රණය නොකළවිට ඊට ප්‍රතිචාර දැක්වීමට භාවිත කළ යුත්තේ,

(1) තොරතුරු දැනගැනීමේ පණතයි.
(2) 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ප්‍රකාශනය නිතියයි.
(3) බුද්ධිමය දේපළ පනතේ ආර්ථික අයිතිවාසිකම් පරිච්ඡේදය යි.
(4) බුද්ධිමය දේපළ පනතේ සදාචාරාත්මක අයිතිවාසිකම් පරිච්ඡේදය යි.
(5) විශ්ව මානව හිමිකම් ප්‍රඥප්තියේ 19 වන වගන්තිය යි.

37) සංවර්ධන සන්නිවේදන සංකල්පය ලොව තුළ ඉස්මතු වීමට බලපෑ සාධකය,

(1) තෙවන ලෝකයේ සංවර්ධන අවශ්‍යතා තෘප්ත කිරීමට ය.
(2) සන්නිවේදන සංකල්පවල බල ගැන්වීම් නිසා ය.
(3) ලෝකයේ යුද ගැටුම් වළකාලීමට ය.
(4) කොමියුනිස්ට් වාදයට යොමු වීම වළකාලීමට ය.
(5) පොදුරාජ්‍ය මණ්ඩලයේ බලපෑම් නිසා ය.

38) මහජන සම්බන්ධතාව වසර 4000ක් තරම් පැරණිය. මෙය සනාථ කරන සාධකය,

(1) අයිවී ලී (Ivylee) ප්‍රථම මහජන සම්බන්ධතා කාර්යාලය පිහිටුවීම ය.
(2) චීන ජාතිකයන් ලෑලි මත වජ්‍ර සූත්‍රය මුද්‍රණය කිරීම ය.
(3) එඩ්වර්ඩ් L. බර්නිස් මහජන සම්බන්ධතා ග්‍රන්ථය රචනා කිරීම ය.
(4) ජූලියස් සීසර්ගේ ප්‍රචාරණ ක්‍රමය.
(5) ඉරාකයෙන් හමු වූ කීලාක්ෂර සහිත මැටි පුවරුව ය.



CamScanner

39) රූපවාහිනී නාලිකා හතරක ග්‍රාහකත්ව වෙනස්වීමේ දත්ත සභාවකට ඉදිරිපත් කිරීමට පර්යේෂකයෙක් යොදාගත යුත්තේ,

(1) වට ප්‍රස්ථාර ය. (2) ස්ථම්භ ප්‍රස්තාර ය.
(3) තිත් කතිර සටහන් ය. (4) වක්‍ර ප්‍රස්ථාර ය.
(5) දත්ත විශ්ලේෂණ වගුය.

40) මාධ්‍ය සංදේශවල යටි අරුත හඳුනා ගැනීම,

(1) අහඹු සිදුවීමක් විය හැකි ය.
(2) නිර්මාණාත්මක ක්‍රියාවක් විය හැකි ය.
(3) ග්‍රාහකයාගේ අවශ්‍යතා සැපිරීමක් විය හැකි ය.
(4) මාධ්‍ය හිමිකරුගේ න්‍යාය පත්‍රය හෙළි කරන්නක් විය හැකි ය.
(5) මාධ්‍ය විචාරය තුළින් ඉස්මතු කරවන්නක් විය හැකි ය.

41) A - මාධ්‍ය අභිසරණතාව වර්ධනය වීමට පොදු රුචිකත්වය ද බලපායි.
B - නිර්මාණ පරිමාණකරණය මාධ්‍ය හිමිකම මත ගොඩනැගී ඇත.
C - නිර්නියාමනයට රාජ්‍ය ක්‍රියාකාරීත්වය බලපාතු ඇත.
මෙම ප්‍රකාශ තුන අතරින් පිළිගත හැකි වනුයේ,

(1) A ප්‍රකාශය පමණි. (2) B ප්‍රකාශය පමණි.
(3) A හා C ප්‍රකාශ පමණි. (4) A හා B ප්‍රකාශ පමණි.
(5) සියලු ප්‍රකාශ පිළිගත නොහැකි ය.

42) නිර්මාණාත්මක නවෝත්පාදන සන්නිවේදනයේ අපේක්ෂාව,

(1) ග්‍රාහකයාගේ දැනුම වර්ධනය කිරීම ය.
(2) ග්‍රාහකයාට අවශ්‍ය නිපුණතාව ලබා දීම ය.
(3) ග්‍රාහකයාට අවශ්‍ය ජීවන තොරතුරු ලබාදීම ය.
(4) ග්‍රාහකයාට අවශ්‍ය ජීවිත අත්දැකීම් ප්‍රවේශ කිරීම ය.
(5) ග්‍රාහකයාට අවශ්‍ය පරමාදර්ශ සැපයීම ය.

43) ඕනෑම සන්නිවේදන ක්‍රියාවලියක ව්‍යුහය සාධන මූලිකාංග ත්‍රිත්වය,

(1) සන්නිවේදකයා ⟶ සංදේශය ⟶ ග්‍රාහකයා
(2) බලපෑම ⟶ ප්‍රතිචාර ⟶ ආකේතකරණය
(3) විකේතකරය ⟶ නාලිකාව ⟶ සන්දර්භය
(4) සන්නිවේදකයා ⟶ සංදේශය ⟶ ප්‍රතිපෝෂණය
(5) ග්‍රාහකයා ⟶ අත්දැකීම් පසුතලය ⟶ බලපෑම

44) ජනමාධ්‍ය ආයතන අතර තාක්ෂණික ගැටලු නියාමනය සඳහා ඇමරිකන් රජය පිහිටවන ලද ආයතනය / පනත ...............

(1) රාජකීය ප්‍රඥප්තිය ලෙස හඳුන්වයි.
(2) ICTA ආයතනය ලෙස හඳුන්වයි.
(3) ෆෙඩරල් සන්නිවේදන කොමිෂන් සභාව (FCC) ලෙස හඳුන්වයි.
(4) යුනෙස්කෝ සංවිධානය ලෙස හඳුන්වයි.
(5) පෙන්ටගනය ලෙස හඳුන්වයි.



CamScanner

45) ශ්‍රී ලංකාවේ නව මාධ්‍ය ප්‍රවණතාවක් <u>නොවීමට</u> ඉඩ ඇත්තේ,

(1) වළාකුළු පරිගණක ක්‍රමය භාවිත කිරීම ය.
(2) ප්‍රතිසම සංඥා තාක්ෂණය භාවිත කිරීම ය.
(3) කෘත්‍රිම බුද්ධිය රූපවාහිනියට භාවිත කිරීම ය.
(4) අතථ්‍ය යථාර්ථය භාවිත කිරීම ය.
(5) දැල් ජාල බහු මාධ්‍ය විකාශ ක්‍රම භාවිත කිරීම ය.

46) මාධ්‍ය සංදේශයක් විශ්ලේෂණය කිරීම පිළිබඳ පහත ප්‍රකාශ විමසා බලන්න.

A - ඍජු ප්‍රකාශිත නොවන යමක් පිළිබඳ සන්නිවේදනය කිරීම අර්ථ නමින් හඳුන්වයි.
B - මාධ්‍ය මඟින් පුද්ගල විශ්වාස කෙරෙහි බලපෑම් කර පිළිගැනීමට ලක් කිරීම අභිප්‍රේරණය ලෙස දක්වා තිබේ.
C - විශ්වාසනීයත්වය සඳහා විශ්ලේෂණ මාන හතරක් ඇත.

මේ අතරින් පිළිගත හැක්කේ,

(1) A හා B පමණි.
(2) A හා C පමණි.
(3) B හා C පමණි.
(4) A, B හා C යන ප්‍රකාශ තුනම පිළිගත හැක.
(5) A, B හා C යන ප්‍රකාශ තුනම පිළිගත නොහැකි ය.

47) මාධ්‍යවල මූලික ලක්ෂණ කිහිපයක් පහත දැක්වේ.

- ❖ ජාලගතකරණයක් සහිතය.
- ❖ ගෘහස්ථ සමීපතාවක් ඇත.
- ❖ සරල ජංගම මාධ්‍යයකි.
- ❖ අඛණ්ඩව ප්‍රකාශයට පත්කරයි.

මෙම ලක්ෂණවලට අනුරූපවන මාධ්‍ය අයත් වන වරණය තෝරන්න.

(1) නව මාධ්‍ය - ගුවන්විදුලිය - රූපවාහිනිය - පුවත්පත
(2) සමාජ මාධ්‍ය - රූපවාහිනිය - පුවත්පත - ගුවන් විදුලිය
(3) නව මාධ්‍ය - රූපවාහිනිය - ගුවන් විදුලිය - ග්‍රන්ථය
(4) සමාජ මාධ්‍ය - ගුවන් විදුලිය - පුවත්පත - රූපවාහිනිය
(5) නව මාධ්‍ය - රූපවාහිනිය - ගුවන්විදුලිය - පුවත්පත

48) නිර්මාණාත්මක චින්තනයට අදාළව ග්‍රැහැම් වෝලස් (Graham Wallas) විසින් දක්වන ලද අදියරවලට අයත් වන්නේ මින් කුමක්ද?

(1) සංවේදනය යි.
(2) පරිකල්පනය යි.
(3) නිරූපණය යි.
(4) සත්‍යාපනය යි.
(5) සංජානනය යි.

49) රූපවාහිනී වෙළඳ දැන්වීමක් මඟින් ඉදිරිපත් කළ සෞඛ්‍යවත් නොවූ ආලේප වර්ගයක් මිලදී ගැනීමට කුමාරි ක්‍රියා කළේ ය. මීට හේතු වූයේ,

(1) දැන්වීමේ ආකර්ෂණීය බව ය.
(2) ස්වකේන්ද්‍රය අවිඥානිකව ක්‍රියාත්මක වීම ය.
(3) ඥාන ව්‍යුහයේ අඩු ප්‍රමිති තත්ත්වයක් තිබීම ය.
(4) රූපවාහිනියට ඇබ්බැහි වීම ය.
(5) මාධ්‍ය කුසලතා නිසි ලෙස සංවර්ධනය නොවීම ය.

50) සන්නිවේදන සමීක්ෂණයක දී සමස්ත ජනගහනය නියෝජනය කරන ඒකකය

(1) දත්තය නම් වේ.
(2) ප්‍රතිශතය නම් වේ.
(3) අනුපාතය නම් වේ.
(4) මධ්‍යයනය නම් වේ.
(5) නියැදිය නම් වේ.

(ල. 1x50=50)

PAST PAPERS WIKI



CamScanner

සියලුම හිමිකම් ඇවිරිණි/முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
தென் மாகாணக் கல்வித் திணைக்களம்
**Department of Education, Southern Province**

13 ශ්‍රේණිය අවසාන වාර පරීක්ෂණය - 2026
தரம் 13 ஆண்டிறுதிப் பரீட்சை - 2026/Grade 13 Final Term Test - 2026

0065

# සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය - II

29 | S | II

කාලය / நேரம் / Time: පැය 03 යි, අමතර කියවීම් කාලය මි. 10 යි

නම / பெயர் / Name ..........................  විභාග අංකය / சுட்டிலக்கம் / Index No. ..........................

- අමතර කියවීම් කාලය මිනිත්තු (10) යි.
- අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදා ගන්න.

උපදෙස්:
- ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.
- එක් ප්‍රශ්නයකට හිමි ලකුණු සංඛ්‍යාව (40) කි.
- පාරිභාෂික වචන හා යෙදුම් ඒ අයුරින්ම භාවිත කර ඇත.

1) සන්නිවේදනය යනු කුමක්දැයි වටහා ගැනීමටත්, නිවැරදි සන්නිවේදන ක්‍රම භාවිත කිරීමටත් එහි මූලික කරුණු පිළිබඳ අවබෝධයක් පැවතිය යුතු ය.

  i. දේශපාලන විද්‍යා පදනමකින් ඉදිරිපත් කර ඇති සන්නිවේදනය පිළිබඳ අර්ථ දැක්වීම ලියා දක්වන්න. (ල. 04)

  ii. සන්නිවේදනයේ මූලික කාර්යයන් හතරක් නම් කර ඉන් දෙකක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ල. 08)

  iii. සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය විෂය හැදෑරීමෙන් ඔබට අත් කර ගත හැකි ප්‍රතිලාභ තුනක් නිදසුන් සහිතව විස්තර කරන්න. (ල. 12)

  iv. ජන සන්නිවේදනය හා සමූහ සන්නිවේදනය අතර වූ මූලික වෙනස්කම් හතරක් සංසන්දනාත්මකව විග්‍රහ කරන්න. (ල. 16)

2) නව මාධ්‍ය යනු අංකිත තාක්ෂණය ඔස්සේ ක්‍රියාත්මක වන මාධ්‍ය විශේෂයකි. එසේම නිර්මාණශීලීත්වයට තෝතැන්නකි.

  i. නව මාධ්‍යවල අන්තර්ගත ලක්ෂණ හතරක් නම් කරන්න. (ල. 04)

  ii. සමාජ මාධ්‍ය ප්‍රභේද හතරක් නම් කර ඉන් දෙකක් පිළිබඳ කෙටි හැඳින්වීමක් කරන්න. (ල. 08)

  iii. "ජන සන්නිවේදනයේ ප්‍රයෝජන.... " මැයෙන් කරුණු තුනක් ඇසුරු කරගෙන ඉරු දින පුවත්පතකට විශේෂාංග ලිපියක් රචනා කරන්න. (ඔබගේ පිළිතුර වචන 150 කට සීමා කරන්න) (ල. 12)

  iv. නිර්මාණශීලීත්වයට අදාළ මූලිකාංග හතරක් සවිස්තරව දක්වන්න. (ල. 16)



CamScanner

3) ගෝලීය සංස්කෘතිය හා මාධ්‍ය සංස්කෘතිය ........ සංස්කෘතික ප්‍රභේද දෙකකි.

i. B. මැලිනොවුස්කි (B. Malinowski) ට අනුව සංස්කෘතිය යන්න අර්ථ දක්වන්න. (ල. 04)

ii. ගෝලීය සංස්කෘතියේ ක්‍රියාකාරීත්වය ලාංකික සමාජයට බලපා ඇති ආකාර හතරක් නම් කර, ඉන් දෙකක් කෙටියෙන් විස්තර කරන්න. (ල. 08)

iii. සංවර්ධනය සඳහා වූ සන්නිවේදන අවශ්‍යතා තුනක් විස්තරාත්මකව පෙන්වා දෙන්න. (ල. 12)

iv. හරවත් මාධ්‍ය සංස්කෘතියක් ගොඩනැගීමට පාසල් අධ්‍යාපන ක්‍රියාවලියට ගත හැකි ක්‍රියාමාර්ග හතරක් සහිතව තේමා පත්‍රිකාවක් විද්‍යාලයීය ජනමාධ්‍ය සමාජයට ලබාදීමට නිර්මාණය කරන්න.

(තේමාවන් විස්තර කළ යුතුය.) (ල. 16)

4) මාධ්‍ය පරිහරණය කිරීම සඳහා විචාරශීලී චින්තනය ඉතා වැදගත් වේ. එසේම මාධ්‍ය නියාමන ක්‍රමද වැදගත් වේ.

i. විචාරශීලි ග්‍රාහකයකු සතුවිය යුතු කුසලතා හතරක් නම් කරන්න. (ල. 04)

ii. ලෝකයේ මාධ්‍ය නියාමනය සඳහා භාවිත ක්‍රම හතරක් නම් කර, ඉන් දෙකක් පිළිබඳව කෙටි විස්තරයක් ඉදිරිපත් කරන්න. (ල. 08)

iii. ශ්‍රී ලංකාවට විශේෂිතව පහත දක්වා ඇති මාධ්‍ය ප්‍රවණතා තුන ඔබට හැකි පමණ පහදා දෙන්න.

(a) තාක්ෂණික ප්‍රවණතා

(b) ආයතනික ප්‍රවණතා

(c ) ග්‍රාහකයා (ල. 12)

iv. නව මාධ්‍ය හා සමාජ මාධ්‍ය භාවිතයට සම්මත ආචාර ධර්ම පද්ධතියක අවශ්‍යතාව කරුණු හතරක් ඔස්සේ පැහැදිලි කරන්න. (ල. 16)

5) ඔබගේ පාසලේ පැවැත්වීමට නියමිත නවක උසස් පෙළ සිසුන් පිළිගැනීමේ උත්සවය සංවිධානය කිරීම ජනමාධ්‍ය විෂය හදාරන සිසුන්ට විදුහල්පතිතුමා පවරන ලදී. ඒ පිළිබඳව ඔබ සියලු දෙනා එක්ව සැලසුමක් පිළියෙල කළ යුතු බවද විදුහල්පතිතුමා පවසන ලදී....... මෙය සිද්ධියකි.

i. මෙම සිද්ධිය කළමනාකරණය කිරීමේදී අවධානය යොමු කළ යුතු කළමනාකරණ අංශ හතරක් නම් කරන්න. (ල. 04)

ii. "මෙවැනි අවස්ථා සංවිධානයේ දී නිර්මාණාත්මක සන්නිවේදනය භාවිතය අනිවාර්ය වේ...." නිර්මාණාත්මක සන්නිවේදනයේ අවශ්‍යතා හතරක් නම් කර, ඉන් දෙකක් පිළිබඳව කෙටියෙන් විස්තර කරන්න. (ල. 08)

iii. ආයතනයක මහජන සම්බන්ධතා පැවැත්වීමේ ක්‍රියාවලිය එම ආයතනයට කොතෙක් දුරට වැදගත් වේද? කරුණු තුනක් ඇසුරෙන් සනාථ කරන්න. (ල. 12)

iv. ඡේදයේ දක්වා ඇති උත්සවය කළමනාකරණය කිරීමේ දී අවධානය යොමු කළ යුතු අවස්ථා හතරක් වෙන වෙනම විස්තර කරන්න. (ල. 16)



CamScanner

6) i. කෘත්‍රිම බුද්ධිය (AI) නිසා ඉහළ සංවර්ධනයක් ලබන ඊකියා ක්ෂේත්‍ර හතරක් නම් කරන්න.

(ල. 04)

ii. සමාජ මාධ්‍යයේ අයහපත් බලපෑම හතරක් නම් කර, ඉන් දෙකක් කෙටියෙන් විස්තර කරන්න.

(ල. 08)

iii. උසස් මාධ්‍ය සාක්ෂරතාවක් ඇති කර ගැනීමෙන් ඔබට ලැබෙන ප්‍රයෝජන තුනක් නිදසුන් සහිතව විස්තර කරන්න. (ල. 12)

iv. වාචික සන්නිවේදනය බොහෝ කාර්යයන් ඉටු කරයි. එවැනි කාර්යයන් හතරක් පිළිබඳ විස්තරාත්මක වාර්තාවක් පාසල් සඟරාවට රචනා කරන්න. (ල. 16)

7) මාධ්‍ය සමීක්ෂණයක දී දත්ත එකතු කර විශ්ලේෂණයෙන් අනතුරුව ප්‍රස්තාරික නිරූපණයන් ලෙස ඉදිරිපත් කළ හැක.

i. මාර්ක් ඒබ්‍රහම් (Mark Abraham) ට අනුව සමීක්ෂණය යන්න අර්ථ දක්වන්න. (ල. 04)

ii. සමීක්ෂණ ක්‍රමය භාවිතයේ වාසි දෙකක් හා අවාසි දෙකක් වෙන වෙනම කෙටියෙන් විස්තර කරන්න.

(ල. 08)

iii. සමීක්ෂණයක ප්‍රතිඵල විස්තර කිරීමට යොදා ගත හැකි ප්‍රස්තාර වර්ග තුනක් ප්‍රායෝගිකව පෙන්වා දෙන්න. (දත්ත ප්‍රස්තාරික නිරූපණයන් මගින් පෙන්වා දීම අනිවාර්ය වේ. උපකල්පිත දත්ත යොදා ගන්න.) (ල. 12)

iv. මාධ්‍ය සමීක්ෂණයක අවසාන වාර්තාව සකස් කරන ආකාරය පියවර හතරක් ඇසුරෙන් විස්තර කරන්න. (ල. 16)



CamScanner

Past Papers Wiki

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## අවසාන වාර පරීක්ෂණය - 2026

### සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය - 13 ශ්‍රේණිය

### පිළිතුරු පත්‍රය

A කොටස

| අංකය | පිළිතුර | අංකය | පිළිතුර | අංකය | පිළිතුර | අංකය | පිළිතුර |
|---|---|---|---|---|---|---|---|
| 1 | 3 | 16 | 4 | 31 | 4 | 46 | 1 |
| 2 | 5 | 17 | 1 | 32 | 3 | 47 | 5 |
| 3 | 4 | 18 | 5 | 33 | 5 | 48 | 4 |
| 4 | 1 | 19 | 3 | 34 | 2 | 49 | 3 |
| 5 | 3 | 20 | 2 | 35 | 3 | 50 | 5 |
| 6 | 2 | 21 | 3 | 36 | 4 | | |
| 7 | 5 | 22 | 3 | 37 | 1 | | |
| 8 | 4 | 23 | 5 | 38 | 5 | | |
| 9 | 3 | 24 | 4 | 39 | 4 | | |
| 10 | 2 | 25 | 2 | 40 | 5 | | |
| 11 | 1 | 26 | 5 | 41 | 3 | | |
| 12 | 2 | 27 | 4 | 42 | 2 | | |
| 13 | 5 | 28 | 5 | 43 | 1 | | |
| 14 | 2 | 29 | 2 | 44 | 3 | ලකුණු 1 x 50= 50 | |
| 15 | 3 | 30 | 5 | 45 | 2 | | |

ලකුණු බෙදී යන ආකාරය

(A) - (I) පත්‍රය = ල. 1x50 = ල.(50)

(B) - (II) පත්‍රය = $\frac{5}{7}$ x ල: 40 = ල. 200

200 ÷ 4 = [50]

(C) අවසාන ලකුණ

ල. 50 + 50 = (100%)

PAST PAPERS WIKI

<u>B කොටස</u>

- ප්‍රශ්න **පහකට** පමණක් පිළිතුරු සපයන්න. එක් ප්‍රශ්නයකට උපරිම ලකුණු **40** බැගින් හිමි වේ.
- පාරිභාෂික වචන හා යෙදුම් ඒ අයුරින් ම භාවිත කර ඇත.

<table>
<tr><th>ප්‍රශ්න අංකය</th><th colspan="2">පිළිතුර</th><th>ලකුණු බෙදී යන ආකාරය</th></tr>
<tr><td>01.<br>i</td><td colspan="2">(ල. 40)<br>හැරල්ඩ් D ලැස්වෙල්ගේ නිර්වචනය ලියා දැක්වීම අපේක්ෂා කෙරේ.<br>(2 පාඩම - TG 12 - පි. 21)</td><td><u>අර්ථ දැක්වීම ප්‍රකාශයට පමණි.</u><br><u>ල. 4/ 0</u></td></tr>
<tr><td rowspan="2">ii</td><td colspan="2" rowspan="2">තොරතුරු සම්පාදනය / අධ්‍යාපනය (උපදෙස් සම්පාදනය) / පෙළඹවීම / විනෝදාස්වාදය .... යන මූලික කාර්යයන් සඳහන් කළ යුතුය. (ද්විතීක කාර්යයන් ප්‍රශ්නයට අදාළ නැත.)<br>(2 පාඩම - TG 12 - පි. 23-24)</td><td><u>නම් කිරීමට</u><br>ල. 1 x 4 = 4<br><u>කෙටියෙන් විස්තර කිරීමට</u><br>ල. 2 x 2 = 4</td></tr>
<tr><td>මුළු ලකුණු 08</td></tr>
<tr><td>iii</td><td colspan="2">සන්නිවේදන කුසලතා වර්ධනය / මාධ්‍ය සාක්ෂරතාව සංවර්ධනයට / විචාරශීලී මාධ්‍ය පරිහරණය කිරීමට හැකිවීම / මාධ්‍ය හා සංස්කෘතිය පිළිබඳ අවබෝධය සංවර්ධනයට / .... නිදසුන් සහිතව විස්තර කළ යුතුය.<br>(1 පාඩම - TG 12 - පි. 12)</td><td><u>නිදසුන් සහිතව විස්තර කිරීමට පමණි.</u><br>ල. 4 x 3 = 12<br><u>නිදසුන් නැති විට ල. ½ කපා හරින්න. නම් කිරීමට පමණක් ලකුණු නොමැත.</u></td></tr>
<tr><td>iv</td><td>ජනසන්නිවේදනය</td><td>සමූහසන්නිවේදනය</td><td rowspan="5"><u>සංසන්දනාත්මක විග්‍රහයට පමණි.</u><br>ල. 4 x 4 = 16<br><br><u>නම් කිරීමට පමණක් ලකුණු නොමැත. (වෙනත් නිවැරදි සංසන්දන විග්‍රහයන්ට ද උපරිම ලකුණු ලබා දෙන්න.)</u></td></tr>
<tr><td>A</td><td>ආයතනගතබවක් සංවිධානගත බවක් ඇත.</td><td>සංවිධානගත බවක් පමණක් ඇත.</td></tr>
<tr><td>B</td><td>කණ්ඩායම විශාලය.</td><td>කණ්ඩායම කුඩා හෝ විශාල විය හැක.</td></tr>
<tr><td>C</td><td>අධි තාක්ෂණයක් සහිත වේ.</td><td>තාක්ෂණික උපකරණ අනිවාර්ය නැත.</td></tr>
<tr><td>D</td><td>S ⟶ R සම්බන්ධතා සමීප නැත.</td><td>S ⟶ R සම්බන්ධතා සෘජුය. සමීපය.<br>(3 පාඩම - TG 12 - පි. 30-32)</td></tr>
<tr><td>(02)<br>i.</td><td colspan="2">ප්‍රශ්නය (ල. 40)<br>අංකිතකරණය / ජාලගතකරණය / අන්තර් ක්‍රියාකාරිත්වය / අධිපාඨනීයත්වය ...... (වෙනත් නිවැරදි පිළිතුරුවලට ද උපරිම ලකුණු ලබා දෙන්න) (4 පාඩම - TG 12 - පි. 67-68)</td><td><u>නම් කිරීමට පමණි.</u><br>ල. 1 x 4 = 04</td></tr>
<tr><td rowspan="2">ii.</td><td colspan="2" rowspan="2">Face book/ Twitter / Linkedin / Pinterest / Instagram / WhatsApp/ Skype …………<br><br>(4 පාඩම - TG 12 - පි. 69-70)</td><td><u>නම් කිරීමට</u><br>ල. 1 x 4 = 04<br><u>කෙටියෙන් විස්තර කිරීමට</u><br>ල. 2 x 2 = 04</td></tr>
<tr><td>මුළු ලකුණු 08</td></tr>
</table>

| | | |
|---|---|---|
| iii. | ප්‍රජානනය / අපසරණය / සමාජ උපයෝගීතාව/ ආපසු ගැනීම / ....<br>විශේෂාංග ලිපිය ආකෘතියට ඉදිරිපත් කිරීම අපේක්ෂා කෙරේ. (උපරිම වචන 150යි).<br>**(3 පාඩම - TG 12 - පි. 42)** | විශේෂාංග ලිපි ආකෘතියට රචනා කිරීමට පමණි.<br>ල. 4 x 3 = 12<br>(විශේෂාංග ලිපි ආකාරයට නොමැති විට ල. 1 බැගින් අඩු කරන්න. නම් කිරීමට පමණක් ලකුණු නොමැත.) |
| iv. | නිර්මාණය / නිර්මාණාත්මක විස්තරය / නිර්මාණ ශිල්පියා / නිර්මාණශීලී රචනය<br>**(7 පාඩම - TG 13 - පි. 05 - 09)** | සවිස්තරව දැක්වීමට පමණි.<br>ල. 4 x 4 = 16<br>(නම් කිරීමට පමණක් ලකුණු නොමැත.) |
| **(03)**<br>i. | **ප්‍රශ්නය (ල. 40)**<br>උපකරණ, පාරිභෝගික ද්‍රව්‍ය, විවිධ සමාජීය සමූහයන්ගේ ව්‍යුහමය ලක්ෂණ, මානව සංකල්පනා, ශිල්ප, විශ්වාස හා චාරිත්‍රයන් ගෙන් අනුබද්ධ සමස්තය සංස්කෘතිය නම් වේ.<br>**(5 පාඩම - TG 12 - පි. 77)** | අර්ථ දැක්වීමට<br>ල. 4/0 |
| ii | නව සංස්කෘතික රටාවක් නිර්මාණය වීම/ මාධ්‍ය තාක්ෂණය භාවිතය ප්‍රබල වීම/ අන්තර්ජාතික න්‍යාය පත්‍රයකට අනුව රටවල් හැසිරවීම / නව තොරතුරු අවකාශ පුළුල් වීම/<br>**(5 පාඩම - TG 12 - පි. 84 - 85)** | නම් කිරීමට<br>ල. 1 x 4 = 04<br>කෙටියෙන් විස්තර කිරීමට<br>ල. 2 x 2 = 04<br>**මුළු ලකුණු 08** |
| iii | මාධ්‍ය ගුණාත්මකභාවය / සහභාගීත්වය හා පුද්ගලාන්තර සම්බන්ධතා ශක්තිමත් කිරීම/ අත්‍යාවශ්‍ය මානුෂීය තොරතුරු සම්පාදනය / ප්‍රතිසංස්කරණවලට මැදිහත් වීම .....<br>**(9 පාඩම - TG 13 - පි. 65 - 68)** | විස්තරාත්මකව පෙන්වා දීමට පමණි.<br>ල. 4 x 3 = 12<br>(නම් කිරීමට පමණක් ලකුණු නොමැත.) |
| iv | මාධ්‍ය අධ්‍යාපනය පුළුල් කිරීම / ශාස්ත්‍රීය ජනමාධ්‍ය ක්‍රියාකාරකම්වලට සිසුන් යොමු කිරීම / ඉහළ මාධ්‍ය වටිනාකමක් ඇති වැඩසටහන් පරිශීලනයට සිසුන් පෙළඹවීම/ සිසුන්ගේ මාධ්‍ය සාක්ෂරතාව සංවර්ධනය කිරීම / ඉහළ මාධ්‍ය හැකියාවක් ඇති ශිල්පීන්ගේ ආභාෂය සිසුන්ට ලබා දීම / ඉහළ මාධ්‍ය වටිනාකමක් ඇති සිසු නිර්මාණ ඇගයීම /...... වැනි වෙනත් නිවැරදි ඕනෑම පිළිතුරකට උපරිම ලකුණු ලබා දෙන්න.<br>5 පාඩම **- TG 12 - පි. 83 – 84) සමඟ ප්‍රායෝගික භාවිත ප්‍රශ්නයකි.** | තේමා පත්‍රිකා ආකෘතියට අනුව විස්තර කිරීමට පමණි.<br>ල. 4 x 4 = 16<br>(තේමා පත්‍රිකා ආකෘතියේ දී කරුණු ඡේද වශයෙන් වෙන් කර තිබිය යුතුය. මාතෘකාවක් හෙවත් තේමාව ප්‍රකාශ කළ යුතුය. ) |

| | | |
|---|---|---|
| iv | | (තේමා පත්‍රිකා ආකෘතිය නැති විට ල. 1 බැගින් අඩුකරන්න. නම් කිරීමට පමණක් ලකුණු නොමැත) |
| **(04)**<br>i | **ප්‍රශ්නය (ල. 40)**<br>විශ්ලේෂණ හැකියාව / තක්සේරුකරණ හැකියාව / කාණ්ඩකරණ හැකියාව / අනුමාන හැකියාව....<br>**(6 පාඩම - TG 12 - පි. 108)** | නම් කිරීමට පමණි.<br>ල. 1 x 4 = 04 |
| ii | ස්වයං නියාමනය / සහනියාමනය / ව්‍යවස්ථාපිත නියාමනය / අභ්‍යන්තරික නියාමනය<br>**(10 පාඩම - TG 13 - පි. 85 - 86)** | නම් කිරීමට<br>ල. 1 x 4 = 04<br>කෙටියෙන් විස්තර කිරීමට<br>ල. 2 x 2 = 04<br>**මුළු ලකුණු 08** |
| iii<br>a | **තාක්ෂණික ප්‍රවණතා** = Digital තාක්ෂණයට ආගමනය / වලාකුළු පරිගණක තාක්ෂණයට ආගමනය / AI තාක්ෂණයට ආගමනය / බහුමාධ්‍යවලට පියනැගීම විස්තර කළ යුතුය/<br>(මෙයින් එක් කරුණක් විස්තර කිරීම ප්‍රමාණවත් ය.) | ප්‍රවණතා විස්තර කිරීමට පමණි.<br>ල. 4 x 3 = 12<br>(නම් කිරීමට පමණක් ලකුණු නොමැත. ප්‍රවණතා තුනෙන් එක් කරුණ බැගින් විස්තර කිරීම අනිවාර්ය වේ. එසේ නොමැතිව එක ප්‍රවණතාවයකින් කරුණු 3 විස්තර කර ඇති විට එක කරුණකට පමණක් අදාළ ලකුණ පිරිනැමිය යුතුය.) |
| b | **ආයතනික ප්‍රවණතා** = හිමිකාරිත්වය / ප්‍රාදේශීය මාධ්‍ය / මාධ්‍යකරුවෝ / ස්ත්‍රී-පුරුෂ සමාජ තත්වය/ මාධ්‍ය නියාමනය/ සංස්කාරක නිදහස.... යන ඒවායින් එකක් විස්තර කිරීම ප්‍රමාණවත්ය. | |
| c | **ග්‍රාහකයා** = සක්‍රිය මාධ්‍ය අන්තර්ගතය ගොඩනැගීමේ හැකියාව ලැබීම / ඒක මාර්ගික සන්නිවේදනය අභිබවා යාම/ සක්‍රිය විචාරශීලී ග්‍රාහකයන් බිහි වීම/ තාක්ෂණය භාවිතයට නැඹුරු වීම..... යන ඒවායින් එකක් විස්තර කිරීම ප්‍රමාණවත් වේ.<br>**(11 පාඩම - TG 13 - පි. 100 - 104)** | |
| iv | (S→ R) දෙපාර්ශවයම සංකුලතාවලින් ආරක්ෂා කිරීමට/ ඉහළ මාධ්‍ය සංස්කෘතියක් ස්ථාපනය කිරීමට/ සමාජයට සිදුවන බලපෑම අවම කර ගැනීමට / රාජ්‍ය ක්‍රියාදාමයන්ට සහය දැක්වීමට / රටක නීතිය සුරක්ෂිත කිරීමට / ළමා අපයෝජන වැළැක්වීමට / පුද්ගලිකත්වය ආරක්ෂා කිරීමට<br>**(10 පාඩම - TG 13 - පි. 91)** | පැහැදිලි කිරීමට පමණි.<br>ල. 4 x 4 = 04<br>(නම් කිරීමට පමණක් ලකුණු නොමැත) |
| **(05)**<br>i | **ප්‍රශ්නය (ල. 40)**<br>සැලසුම / පිළියෙළ කිරීම / විමසුම / ක්‍රියාව<br>**(8 පාඩම - TG 13 - පි. 52)** | නම් කිරීමට පමණි.<br>ල. 1 x 4 = 04 |
| ii | දෛනික හා වෘත්තීය ජීවිතය ශක්තිමත් කර ගැනීමට/ සක්‍රිය පුරවැසියෙකු වීමට / සතුට සැහැල්ලුව වැනි මානව උවමනා පෝෂණයට / සංකීර්ණ අවිවේකී ජීවන අභියෝග ජය ගැනීමට / ගැඹුරු සංකල්ප සරලව අවබෝධ කර ගැනීමට<br>**(7 පාඩම - TG 13 - පි. 03)** | නම් කිරීමට<br>ල. 1 x 4 = 04<br>කෙටියෙන් විස්තර කිරීමට<br>ල. 2 x 2 = 04<br>**මුළු ලකුණු = 08** |

| | | |
|---|---|---|
| iii | ආයතනයට අවශ්‍ය ජන සහභාගීත්වය පුළුල් කර ගැනීමට / නව භාණ්ඩ හා සේවා හඳුන්වා දීමට/ ප්‍රතිරෝධය ජය ගැනීමට / මතභේදාත්මක තත්ත්ව සමනය කර ගැනීමට/ ප්‍රතිරූපය ගොඩනංවා ගැනීමට .... වැනි වෙනත් ඕනෑම නිවැරදි පිළිතුරකට උපරිම ලකුණු ලබා දිය යුතුය.<br>**(8 පාඩම - TG 13 - පි. 35)** | <u>සනාථ කිරීමට පමණි.</u><br>ල. 4 x 3 = 12<br>(නම් කිරීමට පමණක් ලකුණු නොමැත.) |
| iv | ඉලක්ක හඳුනාගැනීම / සැලසුම් කිරීම/ මූල්‍ය පිරිවැය හා එය සැලසුම් කිරීම / ඉලක්ක කන්ඩායම හඳුනාගැනීම/ සේවා කළමණාකරණය ..... වැනි නිවැරදි වෙනත් අංශ කෙටියෙන් විස්තර කිරීම ප්‍රමාණවත් වේ.<br>**(8 පාඩම - TG 13 - පි. 51)** | <u>විස්තර කිරීමට පමණි.</u><br><u>(කෙටියෙන් විස්තර කිරීම ප්‍රමාණවත් ය. දීර්ඝ විස්තර අවශ්‍ය නැත)</u><br>ල. 4 x 4 = 16 |
| (06)<br>i. | **ප්‍රශ්නය (ල. 40)**<br>අවධානම් සහගත රැකියා ක්ෂේත්‍රය / ගුරු වෘත්තිය / ශල්‍ය වෛද්‍ය වෘත්තිය / චිත්‍ර නිරූපණ අංශය/ පරිගණක රැකියා ක්ෂේත්‍රය / යුධ තාක්ෂණ රැකියා ක්ෂේත්‍රය<br>(පොදු ප්‍රශ්නයකි) | <u>නම් කිරීමට පමණි.</u><br>ල. 1 x 4 = 04 |
| ii | මානසික අවපීඩනය/ දරුණු හුදකලා බව ඇති කිරීම / සයිබර් හිරිහැර / ප්‍රචණ්ඩ ක්‍රියාවලට පෙළඹවීම / වැරදි තොරතුරු පළවීම නිසා විවිධ ගැටලු ඇතිවීම/ පුද්ගලික තොරතුරු විවිධ වෙනත් පාර්ශවවලට නතු වීම.<br>**(4 පාඩම - TG 12 - පි. 71)** | <u>නම් කිරීමට</u><br>ල. 1 x 4 = 04<br><u>කෙටියෙන් විස්තර කිරීමට</u><br>ල. 2 x 2 = 04<br>**මුළු ලකුණු = 08** |
| iii | විවිධ මාධ්‍ය පණිවිඩ ලබා ගැනීමේ කැමැත්ත වැඩිවීම/ අපගේ මානසික චර්යා පද්ධතිය පාලනය කර ගැනීමේ හැකියාව / මාධ්‍ය පාලනය කිරීමට බලයක් ලැබීම.<br>**(6 පාඩම - TG 12 - පි. 97 -98)** | <u>නිදසුන් සහිතව විස්තර කිරීමට පමණි.</u><br>ල. 4 x 3 = 12<br><u>(නිදසුන් නොමැතිවිට ල.01 බැගින් අඩු කරන්න. නම් කිරීමට පමණක් ලකුණු නොමැත.)</u> |
| iv | ඉගැන්වීම - උපදෙස් දීම හා මග පෙන්වීමට / පුද්ගලයන් අතර තොරතුරු හුවමාරුව / මානව සබඳතා පවත්වා ගැනීම/ සිතෙහි ඇතිවන භාවයන් ප්‍රකාශයට පත් කිරීම / පුද්ගල පෞරුෂය ඇති කිරීම හා විවිධ කාර්යයන් ඉටු කර ගැනීම ....<br>(පාසල් සඟරා ආකෘතියට පිළිතුරු ලිවීම කළ යුතුය)<br>**(5 පාඩම - TG 12 - පි. 38)** | <u>සඟරා ආකෘතියට රචනා කිරීමට</u><br>ල. 4 x 4 = 16<br><u>(ආකෘතිය නොමැති විට ල. 01 බැගින් අඩු කරන්න. නම් කිරීමට පමණක් ලකුණු නොමැත)</u> |
| (7)<br>i | **ප්‍රශ්නය (ල. 40)**<br>ප්‍රජාවක ක්‍රියාකාරකම් හා ඒවා නිර්මාණය වී ඇති ආකාරය පිළිබඳව සමාජ විද්‍යාත්මක ආකල්ප ඔස්සේ විමසා බැලීමේ දී යොදා ගන්න දත්ත ප්‍රමාණාත්මක දත්ත එකතු කිරීමේ ක්‍රියාවලිය සමීක්ෂණය නම් වේ.<br>**(12 පාඩම - TG 13 - පි. 108)** | <u>අර්ථ දැක්වීමට</u><br>ල. 4/0 |



Past Papers Wiki
සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

| | | |
|---|---|---|
| ii | වාසි = කෙටි කලකින් දත්ත රැස් කිරීමේ හැකියාව / විශාල දත්ත දායකයන් ප්‍රමාණයකින් තොරතුරු එක් රැස් කර ගත හැකි වීම.<br>අවාසි = නිවැරදි, අවංක තොරතුරු ලබා නොදීම / මතකය අඩුකම නිසා අසත්‍ය තොරතුරු ලබා දීම.<br>**(12 පාඩම - TG 13 - පි. 110)** | වාසි අවාසි වෙන වෙනම කෙටියෙන් විස්තර කිරීමට පමණි.<br>ල. 2 x 4 = 08<br>(නම් කිරීමට පමණක් ල. 1 x 4 = 04 ලබා දෙන්න.) |
| iii | උපකල්පිත දත්ත යොදා ගෙන ප්‍රස්තාරික නිරූපණයක් රූප සටහන් ඇසුරෙන් පෙන්වා දීම අනිවාර්ය වේ.<br>A - ස්ථම්භ ප්‍රස්තාර<br>B - වක්‍ර ප්‍රස්තාර<br>C - වට ප්‍රස්තාර<br>**(12 පාඩම - TG 13 - පි. 118 - 119)** | නිරූපණය කිරීමට පමණි.<br>ල. 4 x 3 = 12 |
| iv | හැඳින්වීම/ ක්‍රමවේදය / දත්ත විශ්ලේෂණය / නිගමනය / මූලාශ්‍රය / උපග්‍රන්ථ ... යන පියවරවල් විස්තර කිරීම අපේක්ෂා කෙරේ.<br>**(12 පාඩම - TG 13 - පි. 122 - 123)** | විස්තරව කිරීමට පමණි.<br>ල. 4 x 4 = 16<br>නම් කිරීමට පමණක් ලකුණු නොමැත) |

**සැලකිය යුතුයි (විශේෂ උපදෙස්) :**

**මෙම පිළිතුරු පත්‍රය හා සමාන හා එම අදහස් ඇති පිළිතුරු හෝ ගුරු අත්පොතේ ඇති පිළිතුරු ලියා ඇති විට උපරිම ලකුණු ලබා දිය යුතුය. නිදසුන් දැක්වීම, විස්තර දැක්වීම්වල ප්‍රමාණාත්මක බව හා ගුණාත්මක බව සැලකිල්ලට ගෙන ලකුණු ප්‍රදානය කිරීමට වග බලා ගත යුතුය. එනම් හැමවිටම ලකුණු පටිපාටියේ ඇති උපදෙස් තරයේ පිළිපදින්න. ඔබගේ පහසුව පිණිස පිළිතුර උපුටාගත් ගුරු අත්පොතේ මූලාශ්‍රයද දක්වා ඇත.**

PAST PAPERS WIKI
WWW.PastPapers.WiKi



Downloaded From Past Papers WiKi - Sri Lanka's Largest Past Paper Bank